පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : நீதிச் சேவை ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492

Name of the Institution: Judicial Service Commission

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No.119(4).

<u>පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වර්ෂය : 2023

කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දුන් විධාන	අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනයක් නොමැත.
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් අවදානම් ලේඛනයක් නොමැත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් දෙකකට හැර අනෙකුත් සියල්ලටම මසකට පෙර පිළිතුරු යවා ඇත. අනෙකුත් විගණන විමසුම් දෙක සඳහාද කාලය දීර්ඝ කර ගැනීමෙන් අනතුරුව පිළිතුරු යවා ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සෑම වාහනයක් සඳහාම නියමිත පරිදි වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර ඇති බව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.	මෙම හිඟ ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති අනුව අය කර ගැනීම සඳහා අදාල නිලධාරියා වෙත යවන ලද අවසන් සිහි කැඳවීමේ ලිපියට අනුව අදාල නිලධාරියා විසින් 2024.06.28 වන දින “ලේකම්, අධිකරණ සේවා

	කොමිෂන් සභාව" නමින් පවත්වාගෙන යනු ලබන, ගිණුම් අංක 297-1-001-9-9025039 දරන බැංකු ගිණුමට බැර කිරීමෙන් පියවා ඇති බැවින් මේ වන විට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නොමැත.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී සතියක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	වර්ෂය තුළ ලබා ගත් තත්ත්කාර්ය අතුරු අග්‍රිමයන් අතුරින් දෙකක් හැර සතියක් ඇතුළත කාර්ය නිම වූ වහාම අග්‍රිම නිරවුල් කර ඇත. මේ වන විට සතියක් ඇතුළත කාර්ය නිමවූ වහාම අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇත.
වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2023 වර්ෂයේ සැලකිය යුතු කාලසීමාවක් දක්වාම බල පැවැත්වුනු කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් විවිධ අවස්ථාවලදී දිවයින පුරා පිහිටි අධිකරණවල අධිකරණ කටයුතු සාමාන්‍ය පිරිදි පැවැත්වීමට බාධා ඇති විය. අධිකරණ කටයුතුවලට අදාළ සංඛ්‍යාලේඛන අධිකරණ මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ගෙන්වා ගැනීමට හා එම දත්තයන් හි නිරවද්‍යතාව සනාථ කර ගැනීමටත් සැලකිය යුතු කාලසීමාවක් වැය විය. තවද ආර්ථික අර්බුදය හමුවේ බඳවා ගැනීම් සීමාකර තිබීම හේතුවෙන් අධිකරණවල පැවති උග්‍ර කාර්ය මණ්ඩල හිඟයද මීට සෘජුවම බලපාන ලදී. ඒ අනුව 2023 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2025.07.01දින නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සිටින තනතුරු 07 ක නිලධාරීන් 28 දෙනෙක් මඟින් පුරප්පාඩුව පවතින තනතුරු 15 ක් සඳහා වන පුරප්පාඩු 79 ක රාජකාරී ආවරණය කර ගැනීමට කටයුතු කර ඇත. සමස්තයක් ලෙස ගත්කල අවම සේවක සංඛ්‍යාවක් රාජකාරී කළද, නිසි කළමනාකරණය සහ පරිපාලනය හේතුවෙන් සියලු රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන අතර රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින්, සඵලදායීව, විචක්ෂණශීලී මනා මූල්‍ය පාලනයකින් යුතුව භාවිතා කර ඇති බව දන්වමි
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය .	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් අභ්‍යන්තර විගණන විමසුම් නොපැවතුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනත් 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි .	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් අභ්‍යන්තර විගණන වාර්තා නොපැවතුණි.
මු.රෙ. 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි .	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් අභ්‍යන්තර විගණන වාර්තා නොපැවතුණි.
මු.රෙ. 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබුණි .	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙළ කිරීම සිදු කර නැත.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්යය මණ්ඩලය අනුමත කර තිබුණද, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගිය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉදිකිරීමට නියමිත නව

	ගොඩනැඟිල්ල ඉදිකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ රැස්වීම් පවත්වා නොතිබුණි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	ගිණුම් පිළිබඳ යටත්ව මට්ටමේ විගණන මතයක් ලබා දී තිබූ අතර එහි සඳහන් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම මේ වන විට ගෙන ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ නමුත් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනය කර වාර්තා කිරීමට මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර එහි කටයුතු අවසන් වූ පසු අදාල නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක පුහුණුවක් නියම කිරීම සඳහා කටයුතු සැලසුම් කරමින් පවතී.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ත කාර්යය මණ්ඩලය ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා වැඩි කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති විසින් විගණකාධිපති වාර්තාවේ සඳහන් කර තිබූ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපනය කිරීම හැර (කරුණාකර මෙම වාර්තාවේ පළමුව ඉදිරිපත් කර ඇති කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩුවට අදාල අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය බලන්න) අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපනය කිරීම හැර (කරුණාකර මෙම වාර්තාවේ පළමුව ඉදිරිපත් කර ඇති කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩුවට අදාල අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය බලන්න) අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව